# පූජක පුහුණුව, පූජක මෙහෙවර හා ජීවිතය පිළිබඳ දෙවන වතිකාන මන්ත්‍රණ සභා නියෝගය (DECREE ON PRIESTLY TRAINING -*OPTATAM TOTIUS*, DECREE ON THE MINISTRY AND LIFE OF PRIESTS -*PRESBYTERORUM ORDINIS*): ඉතිහාස අධ්‍යයන ගවේෂණයක්

ඩබ්. ඒ. එන්. ප්‍රනාන්දු

බටහිර සම්භාව්‍ය සංස්කෘතිය හා ක්‍රිස්තියානි සංස්කෘතිය අධ්‍යයන අංශය

උක්ත පර්යේෂණ මාතෘකාව අධ්‍යයනය කිරීම සඳහා දෙවන වතිකාන මන්ත්‍රණ සභාව පිළිබඳ ජී. ඇල්බෙරිගෝ (G. Alberigo) විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහ ප්‍රාථමික මූලාශ්‍රයක් (Primary Source) ලෙස භාවිතයට ගෙන ඇත.

එම ග්‍රන්ථයෙහි අඩංගු **පූජක පුහුණුව, පූජක මෙහෙවර හා ජීවිතය පිළිබඳ නියෝගය** යන ලියවිලි දෙවන වතිකාන මන්ත්‍රණ සභා අවස්ථාවේ සකස් වූ ආකාරය හා එයට පසුබිම් වූ කරුණු පිළිබඳ ව පුළුල් ඉතිහාස අධ්‍යයනයක යෙදීම මෙම පර්යේෂණයේ ප්‍රධාන අරමුණ වේ.

පූජකවරුන් යනු කිතුනු විශ්වාසිකයින්ගේ දේව සේවකයන් ය. පූජකවරයා යනු සේවය නොලබා මිනිසුන්ට සේවය කිරීම සඳහා මිනිසුන් අතරින් ම තෝරා ගත් විශේෂ පුද්ගලයෙකි. එම නිසා ඔහු ජීවත් විය යුත්තේ මිනිසුන් අතර ය. ඔහුගේ පරමාදර්ශය විය යුත්තේ ක්‍රිස්තු චරිතය යි.

මෙහි ප්‍රධාන පර්යේෂණ ගැටලුව වන්නේ එඬේරකු තම බැටළුවන් සමඟ ඇති සබඳතාව මෙන් ගිහි-පූජක සබඳතාව පැවතිය යුතු ආකාරය කෙසේ විය යුතු ද යන්න මෙම නියෝගය විවාදයට ගත් සැසිවාර ලේඛන මගින් පුළුල් ව විමසීම යි.

මෙම නිබන්ධයට අදාළ දත්ත රැස් කර ගැනීම සඳහා යොදා ගත් පර්යේෂණ ක්‍රමවේද ලෙස ලේඛන, ඓතිහාසික හා මූලාශ්‍රය විමර්ශනයන් දැක්විය හැකි වේ. ජී. ඇල්බෙරිගෝ විසින් සම්පාදිත *History of Vatican II* නමැති ග්‍රන්ථ වෙළුම් පහට අමතරව විශ්වකෝෂ, ශාස්ත්‍රීය ග්‍රන්ථ හා ලිපි ආශ්‍රයෙන් ද දත්ත ගොනු කොට තිබේ.

**මූලික පද:** පූජක, ක්‍රිස්තුන් වහන්සේ, එඬේරා, පුහුණුව